## පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව -2010 වර්ෂය

### 1. විසර්ජන ශීර්ෂය -130 - පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 දෙසැම්බර් 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පළාත් පාලන හා පළාත් සභා . අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන වල තත්වය ප්‍රකාශ වන, මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

------------------------------

අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2010 ජනවාරි 01 දින ඉදිරිපත් කර තිබුණි.

**(ආ) ගිණුම් ඉදිරිපත් කිරීම**

-----------------------

(i) අමාත්‍යාංශය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 130 | විසර්ජන ගිණුම |
| 13001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය |

(ii) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ලොග් පොත් | මුදල්.රෙගුලාසි 1645 | යාවත්කාලීනව පවත්වා ගෙනගොස් නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | 2009 වර්ෂයට පෙර සටහන් නොතිබීම. |

**(ඇ) විසර්ජන ගිණුම**

-----------------

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

අමාත්‍යාංශයේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 7,833,480,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 7,046,692,826 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ප්‍රතිපාදනයන්ගෙන් ශුද්ධ ඉතිරිවීම් රු.786,787,174 හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් ව පැවැතිණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 130 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | 155,844,000 | 7,677,636,000 | 143,901,767 | 6,902,791,059 | 11,942,233 | 774,844,941 |

**(ඇ) පොදු තැන්පත් ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.70,358,035 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| අමාත්‍යාංශය | ශීර්ෂය | කාල විශ්ලේෂණය | | 2010 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | |
| | | රු. | රු. | රු. |
| පළාත් පාලන හා පළාත් සභා | 130 | 65,620,098 | 4,737,937 | 70,358,035 |

**(ඉ) අග්‍රිම ගිණුම**

මුදල් රෙගුලාසි 371 කට පටහැනිව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර කාර්ය නිම වී මාස 3 දක්වා කාලයක් ප්‍රමාද වී අග්‍රිමය නිරවුල් කර තිබුණි

## 1.4 වත්කම් කළමනාකරණය

වටිනාකම රු. 29,577,000 ක් වු අමාත්‍යාංශයේ වාහන 5 ක් පිළිවෙලින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට වාහන 3 ක්ද පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට වාහන 1 ක්ද පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට වාහන 1 ක්ද වශයෙන් මුදාහැර තිබුණු අතර විධිමත් ලෙස පවරා දී නොතිබුණි.

1.5 **අනුකූල නොවීම්**

(අ) **නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **ආයතන සංග්‍රහය** | | |
| xxiv පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය | 16,936 | වසර 5ට පෙර විශ්‍රාම ගිය නිලධාරියකුගේ ආපදා ණය මුදල විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් අය කිරීම. |
| xxiv පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය | 1,465,472 | නියැදි පරීක්ෂණයේදී නිලධාරීන් 10 දෙනෙකුගේ ආපදා ණය සඳහා "අවලංගු කල නොහැකි පොරොන්දුව " ලබා ගෙන නොතිබුණි. |
| **චක්‍රලේඛ විධිවිධාන** | | |
| **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| අංක සීඑ/1/17/1 හා 2010 මැයි 14 දිනැති චක්‍රලේඛය | - | චක්‍රලේඛයේ 3.1 ඡේදයට පටහැනිව ඇමතිතුමා වෙත වැඩිපුර වාහන 3 ක් වෙන් කර තිබීම. |

1.6 **කාර්යසාධනය**

2010 වාර්ෂික ඇස්තමේන්තු / ක්‍රියාකාර සැලසුම්වලට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**සැලසුම් කිරීම සහ කාර්යසාධනය**

(i). උතුරුමැද හා නැගෙනහිර පළාත්වල ප්‍රජා සහභාගීත්වයෙන් මාර්ග පනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වර්ෂය අවසානයට මූල්‍ය ඉලක්කය ප්‍රතිශතයක් වශයෙන් 4% ක දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ii). මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම හා වර්ෂයේ ඉලක්කයන් අනුව වර්ෂය තුල උපදේශකයින් පත්කිරීමට සැළසුම් කර තිබුණද පත්කිරීමට කටයුතු කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රගතියක්ද ලබා නොතිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 23 | 2 |
| (ii) | තෘතියික මට්ටම | 3 | 3 | - |
| (iii) | ද්විතියක මට්ටම | 88 | 87 | 1 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 50 | 49 | 1 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 3 | - |
| | එකතුව | 166 | 165 | 4 |